# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**(101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ අමාත්‍යතුමා විසින් 2022 මාර්තු මස 25 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 මාර්තු මස 11 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[112 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය* :** මේ වගන්තිය මඟින් (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය පනතට 154අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ මේ සංග්‍රහය යටතේ වන යම් නීති කෘත්‍යයන්හි දී ඇතැම් ලේඛන විධිමත් ඔප්පු කිරීමෙන් නිදහස් කිරීම වේ.

# සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

එල්.ඩී.—ඕ. 58/2021

## (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක     දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

101 වන අධිකාරයට 154අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**2.** (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 154 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම සංග්‍රහයේ 154අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:—

"ඇතැම් අවස්ථාවල දී ඔප්පු හෝ ලේඛන ඔප්පු කිරීම අවශ්‍ය නොවන බව

154අ. (1) (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (60 වන අධිකාරය වූ) අන්තිම කැමති පත්‍ර ආඥාපනත යටතේ ලියා අත්සන් කරන ලද අන්තිම කැමති පත්‍රයක් හැර, බැලූ බැල්මටම නිසි පරිදි ලියා අත්සන් කරනු ලැබ ඇති බවට පෙනී යන සහ සහතික කිරීම සඳහා නීතිය මගින් නියම කරනු ලැබ ඇති යම් ඔප්පුවක් හෝ ලේඛනයක්-

(අ) මේ සංග්‍රහය ප්‍රකාරව සාමාන්‍ය කාර්ය පටිපාටිය යටතේ ගොනු කරන ලද නඩුවක උත්තරවාදවල හෝ වැඩිදුර උත්තරවාදවල එම ඔප්පුවේ හෝ ලේඛනයේ ලියා අත්සන් කිරීම හෝ නිර්ව්‍යාජභාවය අභියෝගයට ලක් කරනු ලැබ ඇත්නම් සහ විසඳිය යුතු ප්‍රශ්නයක් ලෙස ඉදිරිපත් කරනු ලැබ ඇත්නම් මිස; හෝ

(ආ) අධිකරණයට එවැනි ඔප්පු කිරීමක් අවශ්‍ය වුවහොත් මිස,

මේ සංග්‍රහය යටතේ වූ යම් නීති කෘත්‍යයන්හි දී, එවැනි යම් ඔප්පුවක හෝ ලේඛනයක ලියා අත්සන්

කිරීම හෝ නිර්ව්‍යාජභාවය පිළිබඳ විධිමත් සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවිය යුතු ය:

එසේ වුව ද, මේ සංග්‍රහය යටතේ වූ යම් නීති කෘත්‍යයක දී, යම් නඩුවක පාර්ශ්වයක් ස්වකීය උත්තරවාදවල ඇතුළත් කර නොමැති යම් ඔප්පුවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලා සිටින අවස්ථාවක දී මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

(2) මේ සංග්‍රහය යටතේ ලඝු නඩු කාර්ය පටිපාටිය මත වූ නීති කෘත්‍යයන්හි දී, (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.